සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| **පළමු වාර පරීක්ෂණය** | **2018** | **11 ශ්‍රේණිය** |
| **முதலாம் தவணைப் பரீட்சை** | **2018** | **தரம் 11** |
| **First Term Test** | **2018** | **Grade 11** |

| | |
|---|---|
| ***පෙරදිග සංගීතය - II*** | ***පැය 2 යි*** |
| ***Oriental Music - II*** | ***2 Hour*** |

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01.

I. සියළුම ස්වර ශුද්ධ වූ ස්වර පහේ රාගය කුමක්ද ? (ල . 01)

II. සස රිරි <u>ගග</u> මම ප යන ස්වර මාලාව අයත් රාගය නම් කරන්න. (ල . 01)

III. බිලාවල් රාගයේ වාදී/සංවාදී ස්වර නම් කරන්න. (ල. 02)

IV. පෙරදිග සංගීතය ........................සිද්ධාන්තය මත පදනම් වන අතර අපරදිග සංගීතය .....................යන සිද්ධාන්තය මත පදනම් වේ. (ල.02)

V. ජන ගී වර්ගීකරණය අනුව අනාඝාතාත්මක මෙහෙ ගී ........................ වර්ගයටද ප්‍රශස්ති වන්නම් .................................. වර්ගයටද අයත් වේ. (ල. 01)

VI. තාලයක ප්‍රබලම ස්ථානය හඳුන්වන්නේ කුමන නමකින්ද ? (ල.01)

VII. සැදෑ / කළුවර/කුරග /ගා-වින්  මෙම ගී පාදය සඳහා පදනම් වූ තාලය නම් කරන්න. (ල.01)

VIII. පණ්ඩිත් රවිශංකර්තුමා ............................................. වාදනය සඳහා අති දක්ෂයෙකි. (ල.01)

IX. ගමපප පප-/ගමප පප- / මෙම ස්වර ලිපිය ලියා දැක්වීමට බටහිර සංගීතයේදී ............................... තාල සංකේතය යෙදිය යුතු අතර ධපධ /ස-රි/ යන ස්වර ප්‍රස්තාරය ලියා දැක්වීම සඳහා ....................................... යන තාල සංකේතය ලියා දැක්විය යුතුය. (ල. 01)

X. නූර්ති නාට්‍ය සම්ප්‍රදායේ තාල වාද්‍ය භාණ්ඩය ...............................වන අතර නාඩගම් සම්ප්‍රදායේ තාල වාද්‍ය භාණ්ඩය ............................... වේ . (ල.01)

02. i කාෆි රාගයට අයත් ආරෝහණ/අවරෝහණ, ජාති වාදී, සංවාදී යන විස්තර ලියා දක්වන්න. (ල. 05)

ii එම රාගයට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක ස්ථායී කොටස ගීත/ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ල. 05)

iii එම රාගයට අයත් මුඛ්‍යාංගය ලියා දක්වන්න. (ල.02)

03. i ත්‍රිතාලයට අයත් ඨේකාව (මූල පදය) නියමිත තාල සංඥා සහිතව පද ප්‍රස්තාර කර දක්වන්න. (ල.06)

ii එම තාලයට ගායනය කළ හැකි හෝ වාදනය කළ හැකි ඕනෑම ගීතයක් හෝ වාදිතයක් මුල් කොටස ප්‍රස්තාර කර දක්වන්න. (ල. 06)

04.i ග ප ධ නි /ස් - ධ ප / ම ග ම රි / ස රි ස - ඉහත රාගයට අයත් මධ්‍යලය ගීතයක ස්ථායි කොටස හෝ වාදිතයක් ප්‍රස්තාර කර දක්වන්න. (ල. 04)

ii රාගයේ නම ලියා දක්වන්න. (ල. 04)

iii කෙටි තානාලංකාර දෙකක් ලියා දක්වන්න. (ල.04)

05. i තබ්ලාවක රූප සටහනක් ඇඳ පහත සඳහන් කොටස් නම් කරන්න. (ස්‍යාහි, චාන්ටි, ලව,ගජරා) (ල.04)

ii දයාවෙන් උපදින අක්ෂර 02ක් හා බයාවෙන් උපදින අක්ෂර 02ක් ලියන්න. (ල.04)

iii තබ්ලාවේ නිර්මාතෘවරයා සහ භාරතයේ ප්‍රචලිත තබ්ලා වාද්‍ය ශිල්පියෙකු නම් කරන්න. (ල.04)

06 i පහතරට වන්නමක කොටස් නම් කරන්න. (ල. 04)

ii පහතරට සිංදු වන්නම්වල සුවිශේෂ ලක්ෂණ 4ක් ලියන්න. (ල.04)

iii ඔබ උගත් පහතරට වන්නමක තානම ලියා දක්වන්න. (ල.04)

07. පහත දැක්වෙන පාරිභාෂිත පද අතරින් 3ක් තෝරා ගෙන කෙටි විග්‍රහයක් කරන්න.

I. වාදි
II. සංවාදි
III. වර්ජිත ස්වර
IV. රාග
V. මේල

(ල. 4 X 3= 12)